# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,480 – 1965 අගෝස්තු 13 වැනි සිකුරාද – 1965.8.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය | — | ආණ්ඩුවේ නිවේදන | 1211 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය | 1209 | මිල පාලන දැන්වීම් | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | 1210 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා | — |
| වෙනත් පත් කිරීම් ආදිය | 1211 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් | 1214 |
| | | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

### 1965 අංක 296

අ. ආ. කා. අංක එන්. 107/65.

අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, (393 වන අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 19 වැනි වගන්තිය යටතේ, ලංකා පරිපාලන සේවයේ, එරික් ජැක්සන් ද සිල්වා මහතා, 1965 අගෝස්තු 2 වැනි දින සිට, එකී පනත යටතේ 1965 ජූලි 31 වැනි දින පත් කරනලද ගුවන් විදුලිය හා ප්‍රවෘත්ති කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 අගෝස්තු 6 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.
8-383

---

### 1965 අංක 297

අංකය : ඩී.21/රෙක් ට/188.

**යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරයෙන් ඉල්ලා අස්වීමක්**

1965 ජූලි 31 වෙනි දින සිට යුධ හමුද නිත්‍ය භට සේනාවේ පහත නම් සඳහන් නිලධාරියාගේ අධිකාරයෙන් ඉල්ලා අස්වීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලදී:—

ලුතිනන් (තාවකාලික කපිතාන්) කන්දයියා චන්ද්‍රප්‍රකාසන්, ල. පා. හ. (නි).

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු 4 දින,
කොළඹ දී ය.

8-409

### 1965 අංක 298

අංකය : ඩී 31/රෙක් ට.

**යුද්ධ හමුදාව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1964 දෙසැම්බර් මස 1 වෙනි දින සිට, පහත නම් සඳහන් නිලධාරී තැන කපිතාන් (උපකරණ පාලක) වශයෙන් :—

ලුතිනන් (උපකරණ පාලක) ෂෙල්ටන් මොරිස් ගොඩ්වින් ඇන්ඩ්‍රිස්, ල.ඉ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු 4 දින, කොළඹ දීය.
8-378

---

### 1965 අංක 299

අංකය : ඩී 42/රෙක් ට.

**නිලධාරීන්ගේ පත් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවේ පහත සඳහන් පත්කිරීම් අනුමත කිරීමට ප්‍රසාදය පළකර තිබේ :—

(අ) 1965 ජූලි 14 දින සිට රා.ලං. ගජබාහු නෞකාවේ අණදෙන නිලධාරි වශයෙන් :
ලුතිනන් කොමාන්ඩර් (එන්ඩී) පී. ඩී. නැතැනියල්ස්, රා.ලං.නා.හ.

(ආ) 1965 ජූලි 14 දින සිට රා.ලං. තිස්ස ආයතනයේ අණදෙන නිලධාරි වශයෙන් :
ලුතිනන් කොමාන්ඩර් (සී) ඒ. එච්. ඒ. ද සිල්වා, රා.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු 4 වැනි දින.
8-379

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

**1965 අංක 300**

අංකය : ජේ.එම්. 2/56 (IV)

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින හෝ නැවත නියමයක් කරන තුරු, එන්. ජේ. ඩී. ද එස්. විජයරත්න මහතා 1965 අගෝස්තු 2 වැනි දින සිට 13 වැනි දින දක්වා, හම්බන්තොට මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 1ඒ/48.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. වික්‍රමසිංහ මහතා 1965 අගෝස්තු 14 වැනි, 21 වැනි, 23 වැනි හා 31 වැනි දිනයන්හි, ගාල්ලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 68.සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. ආර්. වික්‍රමතිලක මහතා 1965 අගෝස්තු 14 වැනි දින, මහනුවර මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 1/පී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. කේ. තිරවියනායගම් මහතා 1965 අගෝස්තු 12 වෙනි දින සිට 14 වැනි දින දක්වා, පේදුරුතුඩුවේ දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ රික්වැස්ට් කොමසාරිස් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේ.එල්. 60/ඒ/55.

ජේ. සෝමාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. ජේ. වී. කුරේ මහතා 1965 ජූලි 28 වැනි දින සිට 30 දින දක්වා හා 1965 අගෝස්තු 2 වැනි හා 3 වැනි දිනයන්හි, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 29.බී/61.

එස්. ඩී. ජයසුන්දර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1965 ජූලි 31 වැනි දින සිට 1965 අගෝස්තු 9 වැනි දින දක්වා සහ 14 වැනි දින සිට 23 වැනි දින දක්වා, තංගල්ලේ දිස්ත්‍රික් නඩුකාර තැන, මහෙස්ත්‍රාත් තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 16 ඒ/59.

ඒ. ඕ. එස්. දිසානායක සහ ඩී. ඊ. ධර්මසේකර යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1965 අගෝස්තු 2 වැනි දින, මීගමුවේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 40ඒ/60.

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ජී. පණ්ඩිතසේකර මහතා 1965 අගෝස්තු 5 වැනි දින, හලාවත මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ පුත්තලමේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 3 බී/60.

එස්. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. මතවරාජා මහතා 1965 අගෝස්තු 8 වැනි දින සිට 10 වැනි දින දක්වා සහ 17 වැනි දින සිට 22 වැනි දින දක්වා ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 6 සී/52.

වී. එම්. කුමාරස්වාමි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා මහතා 1965 අගෝස්තු 7 වැනි දින සිට 16 වැනි දින දක්වා, ගම්පොල ක්‍රියා කරන පිණිස මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල මහෙස්ත්‍රාත් තැන අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 26.ඒ/64.

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. සෙන්ට් ඊ. අමරසිංහ මහතා 1965 අගෝස්තු 7 වැනි දින, අවිස්සාවේල්ලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 7/සී/63.

සී. වෙල්ලප්පා මහතා නැති අතර හෝ නැවත නියමයක [illegible] තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1965 අගෝස්තු 18 වැනි දින සිට 21 වැනි දින දක්වා මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 9/61.

එම්. ඒ. සී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. වික්‍රමතුංග මහතා 1965 අගෝස්තු 9 වැනි දින, මාතර දිස්ත්‍රික්කයේ කඳබොඩ පත්තු සහ ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් හා වැල්ලබොඩ පත්තුවේ සහ කඩවත් සතරේ ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 1/48.

ටී. එල්. ජේ. හඩ්ජී මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එච්. අබ්දුල් කාදර් මහතා 1965 අගෝස්තු 19 වැනි දින සිට 21 වැනි දින දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිලි හත්පත්තුවේ හා ගිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සෝමාතිරාජා මහතා 1965 අගෝස්තු 24 වැනි දින සිට 26 වැනි දින දක්වා වවුනියාව හා යාපනය දිස්ත්‍රික්කයන්හි උතුරු වවුනියාවේ හා මුහුදුබඩ පත්තුවල ගම්බද උසාවි සභාපති වශයෙන් හා පූනකාරි-තුන්නුකායි ගම්බද උසාවි අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

සී. ඊ. ජයවර්ධන,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 5 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය : 573,
කොළඹ 12.

8-377

# වෙනත් පත්කිරීම් ආදිය

## නිවේදනයයි

1965 අංක 301

අතිගරු අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව, එතුමා විසින්—

අංක : ඒ.ජේ. 12/64/5.

1. දිවිල්ලේ බෝඅදුරගෙදර බෝධිගුප්ත මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා 4/සාවි 3/14.

2. නීතිඥ ලැල්චන්ද්‍ර ධර්මසිරි විජේගුණවර්ධන මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,

අංක : ඒ.ජේ 38/64/12.

3. සිරිසේන සෙනෙවිරත්න මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

අංක : පා 4/සාවි 38/12.

4. ආතර් හේරත් සමරකෝන් මහතා අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965.8.7 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

8-396

---

1965 අංක 302

(20 වෙනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංක : පා 4/හමප 16/3.

1. 1965.7.20 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරනතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඹ කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට කේ. බී. මේසසූරිය මහතා ද,

අංක : පා 4/හමප 20/1.

2. 1965.7.29 වෙනි දින සිට බදුලු දිස්ත්‍රික්කයේ සොරණාතොට කෝරළයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ගෙදර කුඹුරේ රත්නායක මුදියන්සේලාගේ සුදු බණ්ඩා මහතා ද,

පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන
අධිකරණ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965.8.7 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

8-394

---

## දැන්වීමයි

1965 අංක 303

තුවන් රූම් පරිඩි සව්ජා මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

8-374

## දැන්වීමයි

1965 අංක 304

තෙන්නකෝන් මුදියන්සේලාගේ ඇල්බට් තෙන්නකෝන් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

එච්. සී. ගුණවර්ධන,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ජූලි මස 30 වැනි දින,
කොළඹදීය.

8-373

---

# ආණ්ඩුවේ නිවේදන

එස්. එෆ්. අංක : 1052 එෆ්. 102/6 සිර්.

## සංගණන ආඥාපනත

සංගණන ආඥාපනතේ 3 වන වගන්තිය (143 වන අධිකරය) යටතේ මුදල් අමාත්‍යවරයා විසින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ආතර් රාජකුමාර් රත්නවේල් මහතා සංගණන අධිකාරී වශයෙන් පත් කර ඇත.

හෙ. ජිනදාස සමරක්කොඩි,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ, 1965 ජූලි 27.

8-275

---

## නිවේදනයයි

අංකය : ඒ අයි. 9/1/64.

යාපනේ කොදෙව් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුල එම දිස්ත්‍රික්කයේ රජයේ වෛද්‍ය නිලධාරියෙකුට හෝ වෙනත් වෛද්‍ය නිලධාරියෙකුට මෘත ශරීරයක් කපා පරීක්ෂා කිරීම සඳහා නියම කිරීමට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 365 (1) වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින් මානික්කම් මුරුගේසු මහතා වෙත බලය පවරා ඇත.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965.8.7 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

8-395

---

මගේ අංකය : ඒ එල් 25/65.

## 1957 අංක 48 දරන මෝටර් ප්‍රවාහණ පනත

1957 අංක 48 දරණ මෝටර් ප්‍රවාහණ ආඥාපනතේ 2 (1) වැනි වගන්තිය යටතේ එම පනතේ 2 වැනි වගන්තියේ (7) වැනි සහ (8) වැනි උප වගන්තිවල විධිවිධානයන්ට යටත්ව, 1965 ජූලි මස 27 වැනි දින සිට අවුරුද්දක කාල පරිච්ඡේදයක් සඳහා පී. ඒ. ජිනදාස නියතපාල මහතා ලංකා ගමනාගමන මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස පත් කිරීමට ගරු ජනසතුසේවා ඇමතිතුමා සතුටු වී ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. රාජේන්ද්‍ර,
ජනසතු සේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

ජනසතුසේවා අමාත්‍යාංශය,
කොළඹ, 1965 අගෝස්තු මස 5 වැනි දින.

8-372

ඇල්.ඩී/බී. 80/44

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වන වගන්තිය යටතේ මිණිරත් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරනු ලැබ මීට යාව ඇති උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇත්තාවූ තීරණයන්, කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව ඒ ආඥාපනතේ 29 (3) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 1965 සැප්තැම්බර් 1 වන දින සිට වලංගු විය යුතුය.

ඒ. ඕ. වීරසිංහ,
කම්කරු, රැකීරක්ෂා සහ නිවාස අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 4 දින,
කොළඹ දී ය.

## උපලේඛනය

මිණිරත් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1945 අගෝස්තු මස 24 වැනි දින අංක 9,453 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි දක්වා ඇත්තාවූද, 1948 ඔක්තෝබර් මස 22 වැනි දින අංක 9,914 දරන ගැසට් පත්‍රයේ ද, 1950 ජූනි මස 23 වැනි දින අංක 10,113 දරන ගැසට් පත්‍රයේ ද, 1951 ජූනි මස 29 වැනි දින අංක 10,263 දරන ගැසට් පත්‍රයේ ද, 1953 ජූනි මස 29 වැනි අංක 10,542 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ සහ 1961 ජූලි මස 28 වැනි දින අංක 12,562 දරන ගැසට් පත්‍රයේද පළවූ නිවේදනවල දක්වා ඇති පරිද්දෙන් වෙනස් කරන ලද්දාවූද තීරණ "වාර්ෂික නිවාඩු දවස් (25 වන වගන්තිය)" යන ශීර්ෂය යටතේ එකී උපලේඛනය අගට පහත දැක්වෙන අභිනව තීරණයන් එකතු කරනු ලැබීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය :—

**"ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වන වගන්තිය)**

9. (අ) මෙම ඡේදයෙහි හා 10 වන ඡේදයෙහි දැක්වෙන විධිවිධාන වලට යටත්ව සෑම සේවා යෝජකයකුම විසින් තමා යටතේ සේවයෙහි යොදවාගෙන සිටින්නාවූ සියළුම කම්කරුවන්ට (177 වැනි අධිකාරය වන) නිවාඩු ආඥාපනත යටතේ සැලකෙන පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් පඩි සහිත නිවාඩු දින වශයෙන් දිය යුතුය :—

1. දෙමළ තෛපොන්ගල් දිනය ;
2. නිදහස් අනුස්මරණ දිනය (පෙබරවාරි 4) ;
3. සිංහල සහ හින්දු අළුත් අවුරුදු දිනය ;
4. මැයි දිනය (මැයි 1) ;
5. සිංහල මාස ක්‍රමයෙන් වෙසක් මස පූර්පසළොස්වක් පොහෝ දිනය ;
6. ශුද්ධ වූ මහම්මත් අනාගත වක්තෘන් වහන්සේගේ උපන් දිනය (උන්වහන්සේට සමාදනය වේවා, මිලාඩ්-උන්-නබි) ; සහ
7. නත්තල් දිනය ;

(ආ) ඒ අනුච්ඡේදයෙහි සඳහන් යම් ආණ්ඩුවේ නිවාඩු දවසක් කම්කරුවකු වැඩ වර්ජනයක යෙදී සිටින කාල සීමාවකට යෙදුනු කවර අවස්ථාවකදීවත් ඒ කම්කරුවාට ඉහත දැක්වෙන ඡේදයේ විධි විධාන අදාළ නොවිය යුතුය.

(ඇ) ඉහත දැක්වුනු (අ) අනුච්ඡේදයේ සඳහන් එක් එක් ආණ්ඩුවේ නිවාඩු දිනය වෙනුවෙන් ගෙවිය යුතු පඩිය එම නිවාඩු දිනය යෙදුනු මාසයේ වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවෙන අඩුම වැටුප් ප්‍රමාණයට අඩු නොවිය යුතුය.

10. එසේ වුවද සේවා යෝජකයකු විසින් පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව ඉහත දැක්වුනු ඡේදයෙහි සඳහන් යම් ආණ්ඩුවේ නිවාඩු දවසක කවර කම්කරුවකු වුවත් සිය සේවයෙහි යොදවා ගත හැකි ය :—

(අ) ඒ කම්කරුවාට විකල්ප නිවාඩු දිනයක් වශයෙන්, ඒ ආණ්ඩුවේ නිවාඩු දිනයෙන් පසුව එන දෙසැම්බර් මස තිස් එක්වන දින හෝ එදිනට පෙර දිනයක්, එදවස් ඇතුළත් වන මසයේ වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවිය යුතු අඩුම දෛනික වේතන ප්‍රමාණයට නො අඩු පාරිශ්‍රමිකයක් සහිතව, නිවාඩු දිනයක් හැටියට දිය යුතුය ; නැතහොත්

(ආ) ඒ කම්කරුවට, එබඳු යම් ආණ්ඩුවේ නිවාඩු දිනයක දී වැඩ කරන සාමාන්‍ය දිනයකට අයත් පැ ගණන තුළ කරන ලද වැඩ සඳහා අඩුම දෛනික වේතන ප්‍රමාණය මෙන් දෙගුණය කට නො අඩු පාරිශ්‍රමිකයක් ද වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණනකට වැඩියෙන් වැඩ කරන සෑම පැයක් සඳහා (අඩුම දෛනික වේතනය 8න් බෙදා සොයා ගත යුතු) සාමාන්‍යයෙන් පැයකට ගෑණෙන ප්‍රමාණය මෙන් තුන් ගුණයකට නො අඩු පාරිශ්‍රමිකයක් (පැයකින් කොටසක් වැඩ කළ විට ප්‍රමාණානුකූලවද) ගෙවිය යුතුය."

8-355

---

ඇල්.ඩී.—බී. 36/57.

## 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 33 වැනි වගන්තිය යටතේ ආඥාව

1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 33 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කර්මාන්ත හා ධීවර කටයුතු ඇමති දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, ඉහත කී පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1959 නොවැම්බර් 18 වැනි දින අංක 11,958 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, නීතිගත කිරීමේ ආඥාවෙන් පිහිටුවන ලද නීතිගත සංස්ථාවක්වන ලංකා හාඩ්බෝඩ් නීතිගත සංස්ථාවේ කාර්යයන් සඳහා මීට යා කොට ඇති උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මේ ආඥාවෙන් අනුමත කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කර්මාන්ත හා ධීවර කටයුතු ඇමති.

1965 ක්වූ අගෝස්තු 1 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

| ඉඩමේ නම සහ හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය | ප්‍රමාණය, අ. රූ. ප. | මායිම් | පිහිටීම |
|---|---|---|---|
| ඒ.—ඇල්ලමුල්ල හේන— ... කේ. ටී. ආර්. වික්‍රමසිංහ, කදන, හොරණ, ඇස්. කේ. මිලින් පීරිස්, කදන, හොරණ කේ. යූ. ආර්. වික්‍රමසිංහ, විශ්‍රාම ලත් තැපැල් ස්ථානාධිපති, ගෞතමී ලේන්, ගල්කිස්ස. | 2 2 0 ... | උතුරට : ඇල්ලමුල්ල වත්ත රජයට පවරා ගත් ඉඩම් කැබලි<br>නැගෙණහිරට : ඇල්ලමුල්ල වත්ත රජයට පවරාගත් ඉඩම් කැබලි කළු ගඟ<br>දකුණට : කළු ගඟ<br>බස්නාහිරට : ඇල්ලමුල්ල වත්ත රජයට පවරාගත් ඉඩම් කැබලි : ඩී. සී ඇතුළත් මුදලි හිමිකම් කියන ඇල්ලමුල්ල වත්ත, කළුගඟ | බස්නාහිර පලාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ කදන ග්‍රාම සේවක වසමේ |

| ඉඩමේ නම සහ හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය | ප්‍රමාණය අ. රූ. ප. | මායිම් | පිහිටීම |
|---|---|---|---|
| බී.—ඇල්ලමුල්ල වත්ත— ...<br>ඩී. සී. ඇතුලත්මුදලි, කඳන, හොරණ | 0 3 0 ... | උතුරට : ඇල්ලමුල්ල වත්ත, රජයට පවරා ගත් ඉඩම් කැබලි<br>නැගෙනහිරට : ඇල්ලමුල්ලහේන (කේ. ටී. වික්‍රමසිංහ සහ තවත් දෙදෙනෙකු හිමිකම් කියන)<br>දකුණට : කළු ගඟ<br>බස්නාහිරට : ඇල්ලමුල්ල වත්ත (රජයට පවරාගත් ඉඩම් කැබලි) | බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කඳන ග්‍රාම සේවා වසමේ |
| සී.—ඇල්ලමුල්ල වත්ත— ...<br>දෝන සැලී මෙරායා අමරසේකර, ඉලිඹ, හොරණ | 2 0 0 ... | උතුරට : ගල්බොඩහේන (ඩී. සද්ධම්මපාල ස්ථවිර හිමිකම් කියන ඉඩම් කැබලි)<br>නැගෙනහිරට : ඇල්ලමුල්ල වත්ත (රජයට පවරාගත් ඉඩම් කැබලි)<br>දකුණට : කළු ගඟ<br>බස්නාහිරට : හොරණ-කලවැල්ලාව ප්‍රසිද්ධ පාර | බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කඳන ග්‍රාම සේවා වසමේ |
| ඩී.—ගල්බොඩහේන— ...<br>ඩී. සද්ධම්මපාල ස්ථවිර, සාංඝිකාරාමය, කඳන, හොරණ | 3 0 0 ... | උතුරට : අන්නාසිගල දෙනිය (රොසලින් වික්‍රමසිංහ හා ඇම්. හර්මන් සිංඤෝ හිමිකම් කියන)<br>නැගෙනහිරට : ඇල්ලමුල්ල වත්ත (රජයට පවරාගත් ඉඩම් කැබලි)<br>දකුණට : ඇල්ලමුල්ල වත්ත (ඩී. ඇස්. ඇම්. අමරසේකර හිමිකම් කියන.)<br>බස්නාහිරට : හොරණ–කලවැල්ලාව ප්‍රසිද්ධ පාර. | බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කඳන ග්‍රාම සේවා වසමේ. |
| එච්.—දෙල්ගහ ලන්ද-(කොටසක්)<br>දෙල්ගහලන්ද මුළු ඉඩම් කැබැල්ලට හිමිකම් කියන්නෝ | 3 0 0 කොටස | | |
| 1. ඒ. ඩී. ඇන්ඩිසිංඤෝ, කඳන, හොරණ | 2/9 ... | උතුරට: ඩී. ඊ. මීගොඩ, ඩී. ඇස්. මීගොඩ හා ඩී. ඇන්. මීගොඩ යන අය හිමිකම් කියන දෙල්ගහලන්ද<br>... නැගෙනහිරට: ඇල්ලමුල්ල වත්ත (රජයට පවරාගත් ඉඩම), ලෙබ්බෙගෙ කුඹුර<br>... දකුණට : දෙල්ගහලන්ද (ඩබ්ලිව්. හෙන්ද්‍රික් ... සිංඤෝ හිමිකම් කියන), ඇල්ලමුල්ල වත්ත (රජයට ගත්), ඇම් හරමානිස් සිංඤෝ හිමිකම් කියන අන්නාසිගල දෙනිය)<br>... බස්නාහිරට : හොරණ–කලවැල්ලාව පාර | බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කඳන ග්‍රාම සේවක වසමේ |
| 2. ඩී. කේ. සී. මීගොඩ ,, ,, ... | 5/36 | | |
| 3. ඩී. එච්. මීගොඩ ,, ,, ... | 1,12 | | |
| 4. ජී. මදුරාවති, ,, ,, ... | 1/36 | | |
| 5. කේ. විලියම්, ,, ,, ... | 1,36 | | |
| 6. ඩී. ඊ. මීගොඩ, ,, ,, ... | 1/36 | | |
| 7. සීලවති මීගොඩ, ,, ,, ... | 1/36 | | |
| 8. ඩී. ඇන්. මීගොඩ, ,, ,, ...<br>ඩී. යූ. මීගොඩ, ,, ,, ...<br>දනවති මීගොඩ, ,, ,, ...<br>ලියනෝරා මීගොඩ, ,, ,, ...<br>ජෝර්ජියානා මීගොඩ, ,, ,, ... | 1,36 | | |
| 9. ඩී. පී. වී. මීගොඩ ,, ,, ... | 1/36 | | |
| 10. ඇල්. පී. ඊ. පෙරේරා ,, ,, ... | 1/21 | | |
| 11. ඇල්. පී. දියෝනිස්, ,, ,, ... | 1/21 | | |
| 12. ඇල්. පී. ඩී. පෙරේරා ,, ,, ... | 1,21 | | |
| 13. කේ. වනිගසේකර, ,, ,, ... | 1/42 | | |
| 14. ඩබ්ලිව්. වලෝනෝනා ,, ,, ... | 1/42 | | |
| 15. ඩබ්ලිව්. මිලිනෝනා, ,, ,, ... | 1/42 | | |
| 16. ඇල්. පී. ඇල්පි නෝනා, ,, ,, ... | 1/21 | | |
| 17. එච්. වනිගසේකර, ,, ,, ... | 1/42 | | |
| 18. ඇම්. හර්මන් සිංඤෝ, ,, ,, ... | 1 42 | | |
| 19. ඇල්. පී. කරුණාදස, ,, ,, ... | 1/42 | | |
| 20. ඩී. ඩබ්ලිව්. එස්. විජේසූරිය, 24, මුද්දුව පාර, රත්නපුර. | | | |
| ජේ.—ලෙබ්බෙගෙ කුඹුර (කොටසක්)— ...<br>අයි. වී. දූලියස් අප්පුහාමි, කඳන, හොරණ ...<br>අයි. වී. සීමන් අප්පුහාමි, කඳන, හොරණ ...<br>අයි.වී. ඒනිස් අප්පුහාමි, කඳන, හොරණ ...<br>අයි. වී. දිලෝනෝනා, කඳන, හොරණ ... | 0 2 0 ... | උතුරට : ආර්. පේද්‍රික් සිංඤෝ හිමිකම් කියන දෙල්ගහ වත්ත ...<br>නැගෙනහිරට : රජයට පවරාගත් ඇල්ලමුල්ල වත්ත, අයි. වී. සීමන් අප්පුහාමි හිමිකම් කියන දෙල්ගහවත්ත, අයි. වී. ඒමිය් අප්පුහාමි හිමිකම් කියන හකුරු ගොඩැල්ල වත්ත<br>දකුණට : රජයට පවරාගත් ඇල්ලමුල්ල වත්ත<br>බස්නාහිරට : රජයට පවරාගත් ඇල්ලමුල්ල වත්ත | බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කඳන ග්‍රාම සේවක වසමේ |
| ඩබ්ලිව්.—ගම්බොඩගැලදෙනිය— ...<br>ඩී. ඊ. මීගොඩ, කඳන, හොරණ ...<br>ඩී. ඇන්. මීගොඩ, කඳන, හොරණ ...<br>සීලවතී මීගොඩ, කඳන, හොරණ ...<br>සිඩ්නි කඳනආරච්චි, කඳන හොරණ ...<br>ඇඩ්වින් කඳනආරච්චි, කඳන, හොරණ ... | 1 1 11 ... | උතුරට : වැලිකඩය බිම්ම (අයි වී. සීමන් අප්පුහාමි හා තවත් අය හිමිකම් කියන);<br>... දකුණට : රජයට පවරාගත් ඇල්ලමුල්ල වත්ත<br>... නැගෙනහිරට : එච්. පේද්‍රික් පීරිස් සහ තවත් අය හිමිකම් කියන ගම්බොඩ ඕවිට<br>බස්නාහිරට—රජයට පවරාගත් ඇල්ලමුල්ල වත්ත | බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කඳන ග්‍රාම සේවක වසමේ. |

## මිල පාලන පනත

(විවිධ භාණ්ඩ) මිල පාලක විසින් පනවනු ලැබ 1965 ජූලි 23 වැනි දින අංක 14,459 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ ගිනි පෙට්ටිවල මිලට අදාළ වන ආඥාව වානිජ සහ වෙළඳ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වෙනි වගන්තිය යටතෙහි මෙයින් නිවේදනය කරනු ලැබේ.

ස්ථිර ලේකම්,
වානිජ සහ වෙළඳ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය.

1965 අගෝස්තු 3 දින,
කොළඹ.

8-322

---

ඇල්. ඩී.—බී 101/45.

## පුරාවස්තු ආඥාපනත

(188 වෙනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ 33 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර පුරාවිද්‍යා කොමසාරිස් චාර්ල්ස් ඇඩ්මන්ඩ් ගොඩකුඹුරේ වන මම, මීට යාකොට ඇති උපලේඛනයේ දැක්වෙන රජයේ ඉඩම් කොටස ඒ ආඥාපනතේ කාර්‍යයන් සඳහා පුරාවිද්‍යා තහනම් ඉඩමක් විය යුතු බව මෙම නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

ගොඩකුඹුරේ,
පුරාවිද්‍යා කොමසාරිස්.

1965.8.2 දින, කොළඹදීය.

### උපලේඛනය

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්වල් හා පහත බුලත්ගම කෝට්ඨාශයේ රුවන්වැල්ල නමැති ගමේ පිහිටි අංක ඒ 937 දරන මුලික පිඹුරේ 3, 4 සහ 7 යන බිම් කැබලි වශයෙන් පෙන්නුම් කර ඇති අක්කර 1, රූඩ් 1, පර්චස් 28.6 ක වපසරිය ඇති ඉඩම් කට්ටිය.

8-316

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

ප්‍රධාන මාර්ගයේ සැතපුම් 16 ද. 35 පු. 22 හි ගම්පහ හා ගනේමුල්ල දුම්රිය ස්ථාන අතර ගම්පහ-ජා ඇල හා ගම්පහ-මිනුවන්ගොඩ පාර වැටී ඇති ස්ථානයේ පිහිටි දුම්රිය හරස් පාර අළුත්වැඩියා කරනු ලබන හෙයින් පහත සඳහන් දිනවල දක්වා ඇති කාලය මුළුල්ලේ තුළදී රථවාහන ගමනාගමනයට වසා තබනු ලැබේ.

**පහළ මග හරස් පාර:** 1965.8.21 වෙනි සෙනසුරාදා පස්වරු 6.00 සිට 9.00 දක්වා අර්ධ වශයෙන් හා 65.8.21 දින පස්වරු 9.00 සිට 65.8.22 වෙනි ඉරිදා අළුයම 6.00 දක්වා සම්පූර්ණ වශයෙන්.

**ඉහළ මග හරස් පාර:** 1965.8.28 වෙනි සෙනසුරාදා පස්වරු 6.00 සිට 9.00 දක්වා අර්ධ වශයෙන් හා 65.8.28 වැනි දින පස්වරු 9.00 සිට 65.8.29 දින අළුයම් 6 දක්වා සම්පූර්ණ වශයෙන්.

මේ කාලය තුළදී රථවාහනවලට පහත සඳහන් පාරවල් ප්‍රයෝජනයට ගත හැක :—

(1) ගම්පහ-යක්කල පාරෙන්, කොළඹ-නුවර පාරට.

(2) ගම්පහ-මිනුවන්ගොඩ පාරෙන් හා ගම්පහ-ජාඇල පාරෙන් කොළඹ-මීගමුව පාරට.

ආර්. ඒ. වෛත්‍යලිංගම්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

8—320

## කො/ශ්‍රී සුමන විද්‍යාලය පිරිවෙන, තුම්මෝදර

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ තුම්මෝදර පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියාපදිංචි කිරීමට ලෝලුවා ගොඩ සුමංගල ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මේ දැන්වීම ප්‍රසිද්ධ කළ දිනයේ සිට තිස් දවසක් ඇතුළත මේ ඉල්ලීමට විරුද්ධතාවයක් ඇති නම් මා වෙත දැන්විය යුතුය.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

අංකය : පි. ඇස්. පි. ඊ. 93.

1965 ජූලි මස 30 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

8-271

---

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

කැළණිමිටියාවත මාර්ගයේ සැ. 5 ද. 61 හි කැස්බෑව-නුගේගොඩ පාර වැටී ඇති ස්ථානයේ පිහිටි දුම්රිය හරස් පාර අළුත්වැඩියා කරනු ලබන හෙයින් 1965 අගෝස්තු මස 21 වෙනි සෙනසුරාදා පස්වරු 6 සිට 8 දක්වා අර්ධ වශයෙන් ද, 1965 අගෝස්තු මස 21 වෙනි සෙනසුරාදා පස්වරු 8 සිට 1965 අගෝස්තු මස 22 වෙනි ඉරිදා වැඩ අවසන් වනතුරු වසා තබනු ලැබේ.

මේ කාලය තුළ දී රථවාහනවලට, පල්ලිය පාරේ පිහිටි හරස් පාර ඔස්සේ ඇති පාරෙන් යා හැකියි.

ආර්. ඒ. වෛත්‍යලිංගම්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

7-1322

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

**බස්නාහිර කොට්ඨාශය** — **මීගමු දිස්ත්‍රික්කය**

මීගමුව-ගිරිඋල්ල පාරේ අංක 24/5 දරණ පාලම 65.7.7 දින සිට රථවාහනවලට නැවත විවෘත කර ඇති බව මහජනයාගේ ප්‍රයෝජනය සඳහා දනුම් දෙමි.

ආර්. ජී. වික්‍රමසිංහ,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 65.8.4.

8-315

---

## දැන්වීමයි

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ උතුරු පිටිගල් කෝරලයේ ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ ගවයින් අතර, "රත්නාශව" නැමති රෝගය පැතිරී යන බැවි 1957තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) පනත සහ (සතුන්ගේ) බෝවෙන රෝග පිළිබඳ ආඥාපනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය (470 වැනි පරිච්ඡේදය) යටතේ මා විසින් වර්ෂ 1965.7.2 දින අංක 14,440 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1965.8.4 වැනි දින,
පේරාදෙණියේ
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේ දී.

8-318

## අම්පාර දිස්ත්‍රික්කය

### ග්‍රාම සේවක කොට්ඨාශයක් ප්‍රතිසංවිධානය කිරීම

1965 අගෝස්තු මස 1 වැනි දින පටන් අංක 79 සහිතව ' බ්ලොක් ජේ ' නමින් නව ග්‍රාම සේවක කොට්ඨාශයක් අම්පාර පාලන දිස්ත්‍රික්කයේ සම්මාන් තුරෙයි පත්තුව ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයෙහි ඇති කෙරෙන බව සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. මෙහි පහත සඳහන් ප්‍රදේශ ' බ්ලොක් ජේ ' නව ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුළත් වේ:—

(1) 59.2.16 වැනි දින අංක 138 දරණ ප්‍රධාන සැලසුම්කරුගේ සැලසුමෙන් පෙනෙන අංක 147 හා 150 දරණ කට්ටි අතරින් වැටී ඇති අතිරේක පාරත් අංක 129, 132, 139, 135, 137, 141, 143, 145, 146 සහ 147 දරණ කට්ටිවලට දකුණින් පිහිටි සම්මාන්තුරෙයි ගම පුලුල් කිරීමේ පෙදෙස.

(2) උඩංගා පාරට නැගෙනහිරින්ද, අම්පාර–කල්මුනේ තාවකාලික පාරට දකුණින්ද, පිහිටි බ්ලොක් ' ජේ ' හි ගම පුලුල් කිරීමේ පෙදෙස.

3. මෙම ග්‍රාම සේවක කොට්ඨාශය අයත්වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, මැතිවරණ දිස්ත්‍රික්කය සහ පළාත් පාලන ආයතනයන්ද සැමගේ දැන ගැනීම සඳහා පහත දක්වමි:—

| මහේස්ත්‍රාත් උසාවිය | ග්‍රාමීය උසාවිය | පොලිසිය | උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | මැතිවරණ දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන |
|---|---|---|---|---|---|
| කල්මුනේ ... | සම්මාන්තුරෙයි ... | සම්මාන්තුරෙයි ... | උප්පැන්න, මරණ ලියාපදිංචි කිරීම : සම්මාන්තුරෙයි කොට්ඨාශය | පොතුවිල් ... | 1. සම්මාන්තුරෙයි නැගෙනහිර ගම් සභාව |
| | | | විවාහ ලියාපදිංචි කිරීම : සම්මාන්-තුරෙයි පත්තුව | | 2. සම්මාන්තුරෙයි සුළු නගර සභාව. |

65.8.3 වැනි දින,
උහන කච්චේරියේදී ය.

8–262

ආර්. ජී. ජී. ජී. ඕ. ගුණසේකර,
අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති.

සැම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි